සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2019 (II)

කාලය: පැය 03	මූල්‍ය ක්‍රම (05-I)	විභාග අංකය Index No / சுட்டெண் ....

- ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

1. අ) "ඒකාබද්ධ අරමුදල" යන්න හඳුන්වා එම අරමුදල සම්බන්ධයෙන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

   ආ) "විශේෂ ව්‍යවස්ථාපිත අරමුදල්" යන්න හඳුන්වා එම අරමුදල් සම්බන්ධයෙන් මු.රෙ. 2(4) මගින් දක්වා ඇති විධිවිධාන දක්වන්න. (ලකුණු 10)

2. ඔබ අමාත්‍යාංශය ක්‍රියාත්මක කිරීමට යෝජිත වාරිමාර්ග ව්‍යාපෘතියක් සඳහා ඇස්තමේන්තුගත මූලික පිරිවැය රු.මි. 1500 ක් පමණ වෙතැයි ඇස්තමේන්තු කර ඇත්නම්,

   අ) ව්‍යාපෘති වර්ගීකරණය යටතේ එම ව්‍යාපෘතිය කුමන වර්ගයකට අයත් ව්‍යාපෘතියක්ද යන්නත්, එම වර්ගයේ ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියා පරිපාටිය පැහැදිලි කරන්න. (ලකුණු 10)

   ආ) මු.රෙ. 20 හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2019 මගින් සංශෝධිත පරිදි උක්ත ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තු සැකසීමේදී ඔබ විසින් අනුගමනය කරනු ලබන ක්‍රියා පරිපාටිය පැහැදිලි කරන්න. (ලකුණු 10)

3. අ) නව ඉදිකිරීම් හා වැඩ ව්‍යාපෘති සම්බන්ධයෙන් වියදම් දැරීමට ගණන්දීමේ නිලධාරීන් කෙරෙහි පවත්නා බලතල හා සීමාවන් මු.රෙ. 93 පරිදි පැහැදිලි කරන්න. (ලකුණු 10)

   ආ) බැරකම්වලට බැඳීම් ඇතිකර ගැනීම සම්බන්ධයෙන් සාමාන්‍ය නීතිය ද, වාර්ෂික පුනරාවර්තන සැපයුම් සම්බන්ධයෙන් විධිවිධානයන් ද, මු.රෙ. 94 ප්‍රකාරව වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 10)

4. අ) කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් ගෙවිය යුතු රඳවා ගන්නා ලද මුදලින් ආපසු ගෙවීම සඳහා ඉදිරිපත් කිරීමට ඔබට පැවරී ඇති අවස්ථාවක තැන්පතුවකින් ආපසු ගෙවීම සහතික කරන නිලධාරී වගකිව යුතු යැයි ඔබේ සැලකිල්ලට යොමුවන කරුණු මොනවාද? (ලකුණු 10)

ආ) යම් සංවර්ධන කාර්යයක් සඳහා දෛනික වැටුප් ලබන කම්කරුවන් යොදාගන්නා අවස්ථාවකදී බලය පැවරී ඇති නිලධාරී ලෙස ඔබේ අවධානයට ලක් කළයුතු කරුණු මු.රෙ. ප්‍රකාරව දක්වන්න. (ලකුණු 10)

5. අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල හා හරි වැරදි බැලීම සඳහා වූ සමීක්ෂණ මණ්ඩල වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ) ගබඩා ව්‍යවස්ථාවක් යනු කුමක්ද? ගබඩා ව්‍යවස්ථාවක ඔබ ඇතුලත් කිරීමට අපේක්ෂා කරනු ලබන කරුණු සඳහන් කරන්න. (ලකුණු 10)

6. රු.මි. 500 ක මුලු පිරිවැය ඇස්තමේන්තුවකින් යුතු ඩබල් කැබ් රථ 50 ක් මිලදී ගැනිම සඳහා ප්‍රසම්පාදන කටයුතු කරමින් සිටින අවස්ථාවකදී,

අ) මෙම ප්‍රසම්පාදන කාර්යය සඳහා ඔබ විසින් තිරණය කරනු ලබන ප්‍රසම්පාදන ක්‍රමය කුමක්ද යන්න දක්වා, ඊට පාදක වූ කරුණු දක්වන්න. (ලකුණු 10)

ආ) මෙම ප්‍රසම්පාදන කාර්යය පිළිබඳව කටයුතු කළයුතු කුමන මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවක්ද යන්න දක්වා එම මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවට අදාළ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ විධිවිධාන පැහැදිලි කරන්න. (ලකුණු 10)

****

40